# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2494/05 - 2026 ජුනි මස 22 වැනි සඳුදා - 2026.06.22**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

### ජනාධිපති විධානය

මුද්‍රාව

අනුර කුමාර දිසානායක.

### ජනාධිපති විධානය

වසර ගණනාවක් පුරා ඇති වූ වැටුප් විෂමතා සහ රාජ්‍ය මූල්‍ය කළමනාකරණයට ඇති වන අභියෝග සැලකිල්ලට ගනිමින්, රාජ්‍ය නිලධරයන්ගේ සහ විශ්‍රාමිකයන්ගේ වැටුප් හා විශ්‍රාම වැටුප් පිළිබඳව පවතින ගැටලුවලට විසඳුම් ලබා දීම, රාජ්‍ය සේවකයන්ගේ වෘත්තීය භාවය ඉහළ නැංවීම හා නව තාක්ෂණික ප්‍රවණතා හා ගෝලීය ප්‍රවණතා අනුව රාජ්‍ය සේවය කුමන ආකාරයකට ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණයක් සිදුවිය යුතු ද යන්න සඳහා නිර්දේශ ලබා ගැනීම පිණිස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු ජනාධිපතිතුමා විසින් එකී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වැනි ව්‍යවස්ථාවෙන් තමා වෙත පැවරී ඇති බලතල ක්‍රියාවෙහි යොදවමින්, වැටුප් හා විශ්‍රාම වැටුප් කොමිෂන් සභාවක් ස්ථාපනය කිරීම. (රාජ්‍ය නිලධරයන් යන්නට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නිර්වචනය අදාළ කර ගත යුතුය)

1. තෙල්ගේ අශෝක පීරිස් මැතිතුමා
2. ගරු කුරුප්පුගේ බේමා ඈන් විදුෂී ස්වර්ණාධිපති මැතිතුමිය
3. අලගියාදුර ප්‍රේමලාල් අබේසිංහ ගුණසේකර මැතිතුමා
4. නියන්ගම බාලසූරියගේ මොන්ටි රණතුංග මැතිතුමා
5. නඩරාජ් රවිචන්ද්‍ර මැතිතුමා
6. වෛද්‍ය රන්දොඹගේ විමල් ජයන්ත මැතිතුමා


1A - G 47097 — 353 (2026/06)


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

7. ආචාර්ය ගම්ලත් මොහොට්ටිගේ මුදිත් සුජීව මැතිතුමා
8. හත්තසින්ගේ තිලකවර්ධන මැතිතුමා
9. බ්‍රිගේඩියර්(විශ්‍රාමික) පියල් ජූඩ් ප්‍රනාන්දු මැතිතුමා
10. අහමඩ් ලෙබ්බේ මොහොමඩ් මුක්තාර් මැතිතුමා
11. සෙනරත් තිස්ස බණ්ඩාර රත්නායක මැතිතුමා
12. අබේසිංහ වීරකෝන් ලාල් චන්ද්‍ර වීරකෝන් මැතිතුමා
13. ගජධීර ආරච්චි පියල් පත්මනාත මැතිතුමා
14. ජයවීර පතිරණ මැතිතුමා
15. කොස්වින්නගේ සරත් ලාල් පෙරේරා මැතිතුමා

සුභාශිංසන පූර්වකවයි !

නව තාක්ෂණික ප්‍රවණතා හා ගෝලීය ප්‍රවණතා සැළකිල්ලට ගෙන රාජ්‍ය සේවයේ එක් එක් තනතුරුවලට බඳවා ගැනීමට අදාළව පවත්නා අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්, එක් එක් සේවා කාණ්ඩවලට පැවරී ඇති කාර්යයන්, වගකීම්, රැකියාවේ ස්වභාවය අනුව මුහුණදීමට සිදුවන අවදානම් තත්ත්වයන් හඳුනා ගනිමින්, රාජ්‍ය සේවය කාර්යක්ෂම අයුරින් පවත්වාගෙන යාම හා වෘත්තීයභාවය ඉහළ නැංවීම සඳහා සරිලන වැටුප්, වේතන, දීමනා හා වෙනත් දිරිගැන්වීම් රාජ්‍ය සේවයේ එක් එක් අංශ වෙත ලබාදීමේ අවශ්‍යතාවය පවතින හෙයින් ද,

රාජ්‍ය සේවයේ එක් එක් සේවා කාණ්ඩවලට විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධයෙන් වන නීතිමය ප්‍රතිපාදනයන්ට හා අදාළ ප්‍රතිපත්තිමය ආර්ථික, සමාජීය සහ අදාළ වෙනත් කරුණු සැළකිල්ලට ගනිමින් විශ්‍රාම වැටුප් විෂමතාවයන් නිරාකරණයට ගතයුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් සමාලෝචනයට ලක් කිරීමට රජය අපේක්ෂා කරන හෙයින් ද,

රාජ්‍ය සේවය වඩා කාර්යක්ෂම අයුරින් පවත්වාගෙන යාම අරමුණු කරගෙන, රාජ්‍ය නිලධරයන්ගේ කාර්යක්ෂමතාවය, ඵලදායීත්වය ඉහළ නැංවීමටත්, රාජ්‍ය නිලධාරීන් රාජ්‍ය සේවය හැරයාම වළක්වාලමින් රාජ්‍ය සේවයේ විපුල ඵලදායිතාවය උදෙසා දිරිගන්වන්නා වූ මනා නිපුනතාවන්ගෙන් පරිපූර්ණ පුද්ගලයින් රාජ්‍ය සේවයට ආකර්ෂණය කරගනිමින් එහි රඳවා තබාගත හැකි වන්නාවූත්, දේශීය හා ගෝලීය ප්‍රවණතාවයන් සැළකිල්ලට ගනිමින් රාජ්‍ය සේවයේ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණයක් සිදුකිරීමට රජය අපේක්ෂා කරන හෙයින් ද,

නව තාක්ෂණික වර්ධනයන් මගින් ගෝලීයව රාජ්‍ය සේවයේ වේගවත් පරිවර්තනයන් වෙමින් පවතින වර්තමාන පසුබිම තුළ, ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවය ද, අනාගතයට සරිලන පරිදි, තාක්ෂණිකව සවිබලගැන්වූ, කාර්යක්ෂම හා පුරවැසි කේන්ද්‍රීය සේවයක් බවට පරිවර්තනය කිරීමට රජය අපේක්ෂා කරන හෙයින් ද,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති අනුර කුමාර දිසානායක වන මම, ඔබතුමන්ලාගේ විචක්ෂණභාවය, සාමාර්ථ්‍යය සහ විශ්වාසවන්තභාවය කෙරෙහි මහත්වූ භක්තිය හා විශ්වාසය තබමින් පූර්වෝක්ත ඔබතුමන්ලා, එනම් -

1. තෙල්ගේ අශෝක පීරිස් මැතිතුමා
2. ගරු කුරුප්පුගේ බේමා ඈන් විද්‍යා ස්වර්ණාධිපති මැතිතුමිය
3. අලගියාදුර ප්‍රේමලාල් අබේසිංහ ගුණසේකර මැතිතුමා
4. නියන්ගම බාලසූරියගේ මොන්ටි රණතුංග මැතිතුමා
5. නඩරාජ් රවිචන්ද්‍ර මැතිතුමා
6. වෛද්‍ය රන්දොඹගේ විමල් ජයන්ත මැතිතුමා
7. ආචාර්ය ගම්ලත් මොහොට්ටිගේ මුදිත් සුජීව මැතිතුමා
8. හත්තසින්ගේ තිලකවර්ධන මැතිතුමා
9. බ්‍රිගේඩියර්(විශ්‍රාමික) පියල් ජූඩ් ප්‍රනාන්දු මැතිතුමා
10. අහමඩ් ලෙබ්බේ මොහොමඩ් මුක්තාර් මැතිතුමා
11. සෙනරත් තිස්ස බණ්ඩාර රත්නායක මැතිතුමා
12. අබේසිංහ වීරකෝන් ලාල් චන්ද්‍ර වීරකෝන් මැතිතුමා
13. ගජධීර ආරච්චි පියල් පත්මනාත මැතිතුමා
14. ජයවීර පතිරණ මැතිතුමා
15. කොස්වින්නගේ සරත් ලාල් පෙරේරා මැතිතුමා

රාජ්‍ය නිලධරයන්ගේ වැටුප් හා විශ්‍රාම වැටුප් කොමිෂන් සභාවේ සාමාජිකයින් වශයෙන් මතු දැක්වෙන කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා මෙයින් පත් කරමි.

01. වැටුප් හා විශ්‍රාම වැටුප් ප්‍රතිපත්ති තිරසර ආකාරයට කළමනාකරණය කිරීම පිණිස වසර ගණනාවක් පුරා ඇති වී ඇති වැටුප් විෂමතා සහ රාජ්‍ය මූල්‍ය කළමනාකරණයට ඇති වන අභියෝග සැළකිල්ලට ගනිමින් රාජ්‍ය නිලධරයන්ගේ සහ විශ්‍රාමිකයන්ගේ වැටුප් හා විශ්‍රාම වැටුප් පිළිබඳව ඇති ගැටළු සඳහා තිරසාර විසඳුම් ලබාදීමට නිර්දේශ ඉදිරිපත් කිරීම.

02. 2026 අප්‍රේල් මස 06 දිනැති අංක 26/0622/816/018 – 1 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි අංක SC/FR 23/2014 දරන මූලික අයිතිවාසිකම් පෙත්සමට අදාළ 2026.02.25 දිනැති ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුව සැළකිල්ලට ගනිමින් සමස්ත රාජ්‍ය සේවයේ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණයක් සඳහා වන යෝග්‍ය යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීම.

03. ඉහත යෝජනා ඉදිරිපත් කිරීමේදී නව තාක්ෂණික ප්‍රවණතා හා ගෝලීය ප්‍රවණතා පිළිබඳව ද අවධානය යොමුකර අනාගත වෙනස්වීම්ද පුරෝකතනය කරමින් ඉහත නිර්දේශ හා යෝජනා ඉදිරිපත් කිරීම.

04. වෙනස්වන ගෝලීය තාක්ෂණික පරිවර්තනයන් සමඟ අනුකූල වන අනාගතයට සරිලන පරිදි, තාක්ෂණිකව සවිබලගැන්වූ, පුරවැසි කේන්ද්‍රීය, ආචාර ධර්මානුකූල සහ වගකීම් සහිත රාජ්‍ය සේවයක් ගොඩනැගීම සඳහා උපායමාර්ග නිර්දේශ කිරීම.

තව ද, තෙල්ගේ අශෝක පීරිස් මැතිතුමා පූර්වෝක්ත කොමිෂන් සභාවේ සභාපති ලෙස මෙයින් පත් කරමි.

තව ද, මෙම කොමිෂන් සභාවේ **ලේකම් වශයෙන් ඩී.එම්.සී. නාලක දිසානායක මැතිතුමා** පත් කරමි.

තව ද, මෙයින් පවරනු ලබන කර්තව්‍යයන් ඉටුකරලීමට අදාළව අවශ්‍ය විය හැකි පරිදි පරීක්ෂණ කිරීම සහ කරුණු විමර්ශනය කිරීම පිණිස උපදෙස් නිකුත් කිරීමට උක්ත කොමිෂන් සභාව වෙත මම මෙයින් බලය පවරමි.

තව ද, පෙර කී කොමිෂන් සභාවේ සාමාජිකයින් වන ඔබ කලින් කලට මා හට වාර්තා ඉදිරිපත් කිරීමට මෙයින් බලය පවරමි.

තව ද, මෙම කාර්යයන් ක්‍රියාත්මක කිරීම වසරක් (අවු.01) තුළ ඉටු කිරීමට කටයුතු කළ යුතුය.

තව ද, මෙම කොමිෂන් සභාව විසින් උපදෙස් නිකුත් කරනු ලැබිය හැකි නැතහොත් තොරතුරු ලබාගනු පිණිස සහාය ඉල්ලා සිටිය හැකි සියලුම රජයේ නිලධරයන් හා එබඳු සෙසු තැනැත්තන් විසින් එම කාර්යය සම්බන්ධයෙන් නිසි අයුරින් පිළිපැදිය හැකි එබඳු උපදෙස්වලට අනුකූලව ක්‍රියාකළ යුතු යැයි ද, ලබාදිය හැකි සියලුම සහාය සැලසිය යුතු යැයි ද, සැපයිය හැකි සියලුම තොරතුරු ලබාදිය යුතු යැයි ද මම මෙයින් සියලුම රජයේ නිලධරයන්ට සහ සෙසු තැනැත්තන්ට නියම කොට විධාන කරමි.

තව ද, කිසියම් රාජ්‍ය නිලධරයකු හෝ කිසියම් අමාත්‍යාංශයක, රජයේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක හෝ වෙනත් එබඳු ආයතනයක නිලධාරියකු විසින් පෙර කී කොමිෂන් සභාව විසින් පවරන ලද රාජකාරි ඉටු කිරීම ප්‍රමාද කරන හා පැහැර හරින සියලු අවස්ථා මා හට වාර්තා කරන ලෙස පෙර කී කොමිෂන් සභාවට මම මෙයින් නියම කොට විධාන කරමි.

වර්ෂ දෙදහස් විසිහයක් වූ ජූනි මස 22 වන දින වූ මෙදින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ කොළඹ දී දෙන ලදී.

ගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ආචාර්ය **එන්.එස්. කුමානායක,**
ජනාධිපති ලේකම්.

EOG 06 - 0260

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.